ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு

# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2022-10-18 |

පැමිණිලිකරු : එම්.එම්. අනුලාවතී මාරසිංහ මිය,
අංක 506/472, ඉකිරිවැව,
අත්තනකඩවල.

වගඋත්තරකරුවන් :

01. නේවාසික ව්‍යාපාර කළමණාකරු
නේවාසික ව්‍යපාර කළමණාකාර කාර්යාලය
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
මොරගහකන්ද කලාපය,
බකමූණ.

02. අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
අංක 500, ටී.බී.ජයා මාවත,
කොළඹ 10.

03. කොට්ඨාශ කළමණාකරු,
කොට්ඨාශ කළමණාකාර කාර්යාලය,
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
අත්තනකඩවල.

04. ඒකක කළමණාකරු,
ඒකක කළමණාකාර කාර්යාලය,
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.
අත්තනකඩවල.

<u>පැමිණිලි අංකය</u> :- ***HRC/AP/234/2014(S)***

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ ගොනු කර ඇති පැමිණිල්ල මගින් සඳහන් කර ඇත්තේ, තම පියා වන එම්.එම්.ගුණරත්න යන අය වෙත මහවැලි අධිකාරිය විසින් ලබා දී තිබූ අංක 296 දරණ වාරි ඉඩමේ පසු උරුමය සඳහා ඔහුගේ දියණිය වන අනුලාවතී මාරසිංහ යන තමන්ව නම් කරන ලෙස 2011.11.10 වැනි දිනැති ලිපිය මගින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, බකමූණ කාර්යාලය වෙතින් ඉල්ලීමක් කරන ලද නමුත් තම පියා මිය යන 2011.12.25 වන දින තෙක් අදාළ ඉල්ලීම පිළිබඳව කටයුතු කරමින් පසුඋරුමය තමන්ගේ නමින් ලියාපදිංචි කිරීමට වගඋත්තරකරු කටයුතු නොකළ බවත්, එමඟින් තම අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවත්ය.

වගඋත්තරකරුගේ ප්‍රකාශය :-

2014.06.04 දිනැති අංක ***RPM/G/L/AT/33*** දරණ වාර්තාව කොමිෂන් සභාව වෙත යොමු කරමින් වගඋත්තරකරු දන්වා ඇත්තේ, මොරගහකන්ද කලාපයේ අත්තනකඩවල කොට්ඨාශයේ ජයසිරිපුර ඒකකයේ අංක අ.ග.පි.පො.358 හි දරණ ප්‍රමාණයෙන් හෙක්:1.01 වන වාරි ඉඩම සඳහා පැමිණිලිකාරියගේ පියා වන මාරසිංහ මුදියන්සේලාගේගෙදර ඥාණරත්න බණ්ඩා යන අය වෙත අංක පො/ජී/ජය/ප්‍ර/වා/3954 දරණ ප්‍රධාන පත්‍රය ලබා දී ඇති බවයි.

මෙම දීමනා පත්‍ර සහිත ඉඩමේ පසුඋරුමය මාරසිංහ මුදියන්සේලාගේ ගෙදර සුධර්මා ඉන්දුමතී මාරසිංහ යන අය වෙත නම් කර තිබූ බවත්, පසුව ප්‍රධාන පත්‍රකරු විසින් මෙම ප්‍රධාන පත්‍ර සහිත ඉඩමේ පසු උරුමය තමාගේ දියණියක වන පැමිණිලිකාර එම්.එම්.අනුලාවතී මාරසිංහ යන අය වෙත නම් කර දෙන ලෙස 2011.11.10 දිනැති ලිපිය ඒකක කළමණාකරු වෙත ඉදිරිපත් කර ඇති බවත්, ඒකක කළමණාකරුගේ 2011.11.08 දිනැති ලිපිය සමඟින් අදාළ පසුඋරුමය නම් කිරීමේ ඉල්ලීම සමඟ ලේඛන අත්තනකඩවල කොට්ඨාශ කළමණාකරු මඟින් තම කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇති බවත් දක්වා ඇත. ඒ අනුව තම කාර්යාලයේ ඉඩම් අංශයේ ඉඩම් නිලධාරී විසින් එම නම් කිරීම ලියාපදිංචි කිරීම නිර්දේශ කර ඇති නමුත් නේවාසික ව්‍යාපාර කළමණාකරු විසින් අදාළ අනුමැතිය ලබා දී නොමැති බවත්, ඒ අනුව නම් කිරීම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචිය සඳහා යොමුකර නොමැති බවත් දක්වා ඇත.

ඉහත පසුඋරුමය නම් කිරීමට අදාළ ලේඛන තම කාර්යාලයට ලැබී සති දෙකක කාලයක් තුළ එනම් 2011.11.25 වන දින ප්‍රධාන පත්‍රකරු මිය ගොස් ඇති බව පැහැදිලි වන බවත්, සාමාන්‍ය රාජකාරී ස්වභාවය අනුව හා ඉඩම් අංශයේ පවතින අනෙකුත් කඩිනම් රාජකාරී වැඩ කටයුතු සමඟ මෙවැනි නම් කිරීමක් ලියාපදිංචි කිරීමේ කාර්යාලයට යොමු කිරීමට සති දෙකක තුනක කාලයක් ගත වීමක් සිදු වන බවත්, එම තත්වය මත මෙම පසුඋරුමය නම් කිරීම ප්‍රධාන පත්‍රකරු ජීවත්ව සිටියදී සිදුකිරීමට නොහැකි වී ඇති බවත් දක්වා ඇත.

පැමිණිල්ල සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් DL/01/48 /උප/ 254 යටතේ 2015.05.23 වාර්තාවක් යොමු කරමින් දන්වා ඇත්තේ, ප්‍රධාන පත්‍රකරු පළමුව හැරියට් කුමාරිහාමි යන අය සමඟ විවාහ වී ඔහුට දාව දරුවන් 04 දෙනෙක් සිටි බවත්, එම දරුවන් සියලු දෙනාහට ඉඩම් ලැබී ඇති බවත්, ප්‍රධාන පත්‍රකරු හැරියට් කුමාරිහාමිගෙන් දික්කසාද වී ඇති බවත්, පොඩි මැණිකා යන අය සමඟ සිරිත් විවාහයක් කරගෙන ඇති බවත්, එම විවාහයේ එකම දරුවා දෙදරු මවක් වන පැමිණිලිකාර එම්.එම්.අනුලාවතී මාරසිංහ මහත්මිය වන අතර, ඇයට හෝ ඇයගේ කලත්‍රයාට මහවැලි ඉඩම් ලැබී නොමැති බවත්, දක්වා ඇත. පැමිණිලිකාරිය නමින් අදාළ වාරි ඉඩම් පසුඋරුමය නම් කිරීම කළ හැකිද යන්න පිළිබඳව නීතිපති උපදෙස් ලබා ගැනීමට කටයුතු කළ බවත්, නමුත් පැමිණිලිකාරිය නමින් පසු අයිතිය නම් කිරීමට හැකියාවක් නොමැති බවට නීතිපති උපදෙස් ලැබී ඇති බවත් දක්වා ඇත.

**විමර්ශනය :-**

අංක පො/ජී/ජය/ප්‍ර/වා/3959 දරණ ප්‍රධාන පත්‍රයේ දෙවන පසුඋරුමය පැමිණිලිකාරිය වන අනුලාවතී මාරසිංහ යන අයට පවරන ලෙස ප්‍රධාන පත්‍රකරු වන එම්.එම්.ජී.ඥාණරත්න යන අය විසින් 2011.11.10 දිනැති ලිපිය මඟින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙතින් ඉල්ලීමක් කර ඇති අතර, මාරසිංහ මුදියන්සේලාගේ ඥාණරත්න යන අය පැමිණිලිකාරියගේ පියා බවත්, 2011.12.25 වන දින එම්.එම්. ඥාණරත්න යන අය මියගොස් ඇති බවත් නිරීක්ෂණය වේ.

නීතිපති දෙපාර්තමේන්තුව විසින් පසුඋරුමයට අදාළ උපදෙස් ලබා දී ඇති අතර, අනුප්‍රාප්තිකයා නම් කිරීමේ හා අවලංගු කිරීමේ ආකෘතිය අනුව 2011.11.08 වන දින සාක්ෂිකරුවන්ගේ නම් සහ ලිපිනයන් හා අත්සන් ගෙන ඇති බවද නිරීක්ෂණය වේ.

2011.12.09 දින නේවාසික ව්‍යාපාර කළමණාකාර කාර්යාලයටත් 2011.12.09 දින ඉඩම් අංශය වෙතටත් පසුඋරුමය නම් කිරීමේ ගොනුව කොට්ඨාශ කාර්යාලය වෙතින් යොමුකර ඇති අතර, 2016.12.27 දිනැති ලිපිය මඟින් ඉඩම් රෙජිස්ට්‍රාර්, පොළොන්නරුව වෙත අනුප්‍රාප්තිය ලියා පදිංචිය සිදු කිරීමට කටයුතු කර ඇති බවද නිරීක්ෂණය වේ.

පැමිණිලිකාරිය තම පැමිණිල්ල මඟින් ප්‍රධානකොටම ප්‍රකාශ කර ඇත්තේ, 2011.11.10 දින තමා නමින් ඉල්ලූම් කර තිබූ පසුඋරුමය ලියාපදිංචිය සිදු කිරීමට 2011.12.27 දින දක්වා ප්‍රමාද කිරීම හේතුවෙන් වගඋත්තරකරුවන් තම අයිතිවාසිකම් උල්ලංඝනය කරන ලද බවයි.

වගඋත්තරකරුවන් දන්වා ඇත්තේ, මෙවැනි පසුඋරුමයක් ලියාපදිංචි කිරීමට යැවීම සඳහා සති දෙකක තුනක කාලයක් ගත වන බැවින් පැමිණිලිකාරියට අසාධාරණයක් සිදු වී නොමැති බවය. පැමිණිලිකාරිය නමින් පසුඋරුමය නම් කරන ලෙස ඉල්ලා ප්‍රධාන පත්‍රකරු විසින් 2011.11.10 වන දින ඒකක කළමණාකරු වෙත ලබා

දී ඇති ඉල්ලීම් ලිපිය 2011.11.08 දිනැති ලිපියක් මගින් කොට්ඨාශ කළමණාකරු, අත්තනකඩවල වෙත යොමු කර ඇති බව නිරීක්ෂණය වන අතර, 2011.12.12 වන දින ඉඩම් නිලධාරී වෙත කොට්ඨාශ කළමණාකරු විසින් 'නිර්දේශ ලබා දෙමි' මැයෙන් ලෙස සඳහන් කර ඇත.

ඒකක කළමණාකරුගේ මෙම ලිපිය 2011.12.09 දින කොට්ඨාශ කාර්යාලය වෙත ලැබී ඇති බව නිරීක්ෂණය වන අතර, 2011.12.14 වන දින අදාළ ඉල්ලීම නේවාසික කළමණාකරු වෙත ලැබී ඇති බවද නිරීක්ෂණය වේ.

2011.12.25 වන දින ප්‍රධාන පත්‍රකරු මියගොස් ඇති අතර, අදාළ පසුඋරුමය නම් කිරීමේ ඉල්ලීම 2011.12.27 වන දින ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙත යොමු කිරීමට කටයුතු කර ඇති බව නිරීක්ෂණය වන මුත් අදාළ ඉල්ලීම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙත යවා නොමැත.

පැමිණිලිකාරිය නමින් පසුඋරුමය නම් කිරීම සඳහා ඉල්ලීම් කළ 2011.11.10 දිනයේ සිට 2011.12.25 වන දින දක්වා එනම් ප්‍රධාන පත්‍රකරු මිය යන දිනය වන තෙක් දින 45 ක් උරුමය නම් කිරීමේ ඉල්ලීම් ලිපි ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ තිබී ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව මෙම දින 45 ක කාලය තුළ රජයේ වැඩ කරන දිනයන් තුළ අදාළ ප්‍රධාන පත්‍රකරුගේ ඉල්ලීම ඉටු කිරීමට ප්‍රමාණවත් කාලයක් වගඋත්තරකරුවන්ට තිබූ බවද නිරීක්ෂණය වේ.

අදාළ පසුඋරුමය නම් කිරීමට ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත ඉල්ලීම භාර දුන් දිනයේ සිට ඒ පිළිබඳව විමසීම් කරන ලද බව පැමිණිලිකාරිය ප්‍රකාශ කරන අතර, වගඋත්තරකරුවන් හිතාමතාම තම කාර්යය අතපසු කරන ලද බව පැමිණිලිකාරිය ප්‍රකාශ කර ඇත.

පසුඋරුමයක් නම් කිරීමේ කාර්යයන් ඉටු කිරීම සඳහා දින 45 ක් ලබා ගැනීම තුළින් පැමිණිලිකාරියට බලවත් අසාධාරණයක් සිදුකර ඇති බව නිරීක්ෂණය වන අතර, එමගින් පැමිණිලිකාරියට හිමිවිය යුතුව තිබූ හිමිකමක් අහිමි වී ඇති බවද නිරීක්ෂණය වේ.

**නිගමනය :-**

ඉහත සියලු කරුණු සලකා බැලීමේදී 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) හි සඳහන් පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙම පරීක්ෂණයෙන් පසුව නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) හි සඳහන් පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම උල්ලංඝනය වී ඇති බැවින්, අදාළ පසු උරුමය ලේඛනගත කිරීමට කටයුතු කළ යුතු බව මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2022. 11. 24 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපතිනී,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විජිත නානායක්කාර,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. Vijitha Nanayakkara
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- 01. අමාත්‍යතුමා,
වාරිමාර්ග අමාත්‍යාංශය,
500, ටී.බී ජයා මාවත,
කොළඹ 10.

02. මානව හිමිකම් කොමිෂන් සභා ප්‍රාදේශීය කාර්යාලය,
අනුරාධපුර.

B/